

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
சமுத்திர பல்கலைக்கழகம்
The Ocean University of Sri Lanka

2019

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report



නිපුණතා සංවර්ධන, රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

திறன்கள் அபிவிருத்தி ,வேலை வாய்ப்பு மற்றும் தொழில் உறவுகள் அமைச்சு

Ministry of Skills Development, Employment and Labour Relations

වාර්ෂික වාර්තාව හා ගිණුම්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2019

නිපුණතා සංවර්ධන, රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

අංක : 15, කාක දුපත, මට්ටක්කුලිය, කොළඹ 15.

දුරකථන - 011-4346973 ෆැක්ස් - 011-4346993

විද්‍යුත් තැපෑල : oceanuniversity@ocu.lk

අන්තර්ජාලය : www.ocu.lk

පටුන

01. උපකුලපති පණිවුඩය

02. පාලන මණ්ඩලය සහ සංයුතිය

03. ශාස්ත්‍රීය සභාව සහ සංයුතිය

04. ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ ආරම්භය , විකාශය , අරමුණු

05. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ, කාර්යභාරය,සේවා දායකත්වය

06. උසස් අධ්‍යයන අංශය

07. පුහුණු අංශය

08. පාලන අංශය

09. අභ්‍යන්තර විගණන අංශය

10. ශේෂ පත්‍රය සහ ආදායම් වියදම් ගිණුම්

11. විගණකාධිපති වාර්තාව

12. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

01. උපකුලපති පණිවුඩය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ස්ථාපිත වී පස් වසරක සේවා කාලය තුළදී විශ්වවිද්‍යාලය සඳහා 2019 වසරේ ජුනි 26 වැනි දින පත්වූ දෙවන උපකුලපතිවරයා වශයෙන් 2019 වාර්ෂික වාර්තාව සඳහා පණිවුඩයක් සටහන් කිරීමට ලැබීම භාග්‍යයක් ලෙස සළකමි.

ශ්‍රී ලාංකීය ආර්ථිකයට අනන්‍යය වූ ධීවර, සාගර සහ සමුද්‍රීය විෂය සමගාමී විශ්වවිද්‍යාලයක් ලෙස වර්ධනය කළ යුතු ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පවතින තත්ත්වය අධ්‍යයනය කර සංවර්ධනය කළ යුතු අංශයන් සහ ඉලක්කගත නිර්ණායකයන් මත පදනම්ව විශ්වවිද්‍යාලයේ ඉදිරි ගමන්මඟ තීරණය කිරීමට අවශ්‍ය වූ ක්‍රියාමාර්ග හඳුනා ගැනීම වසර තුළදී ඉටු කිරීමට තිබූ කාර්යභාරයක් ලෙස මවිසින් හඳුනාගන්නා ලදී. ඒ අනුව, ක්‍රියාත්මක වී විශ්වවිද්‍යාලීය දිශානතිය තීරණය කර ගැනීම සඳහා ඉදිරි පස්වසරක ක්‍රියාකාරිත්වය ඇතුළත් සංයුක්ත සැළැස්ම සැකසීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාවසායකත්ව දෙපාර්තමේන්තුව හා සම්බන්ධව නිමකරන ලදී. විශ්වවිද්‍යාලයේ පවත්නා ගැටළු සහගත තත්ත්වයන් මූලිකව හඳුනාගෙන එම ගැටළු නිරාකරණයට අවශ්‍ය පියවරයන් සංයුක්ත සැළැස්ම තුලට ඇතුළත් කිරීම උදෙසා සියලු පාර්ශවයන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට හැකි වීම මත විශිෂ්ඨ සංයුක්ත සැළැස්මක් සැකසීමට පාදක වූ බව සතුටින් සටහන් තබමි.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පැනිකඩ ව්‍යුහගත රාමුවක් තුළ ස්ථානගත කිරීමට අවශ්‍ය පියවරයන් වසර තුළදී ක්‍රියාත්මක කිරීමට හැකි විය. ඒ අනුව, නාවික ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය සහ ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨය සඳහා පීඨාධිපතිවරුන් පත් කිරීම ද, උපාධි පාඨමාලා සඳහා අංශාධිපතිවරුන් පත් කිරීම ද සිදුකරන ලදී. තවද, විශ්වවිද්‍යාල ප්‍රථම පර්යේෂණ සමුළුව 2019 වසර අගභාගයේදී සාර්ථකව පැවැත්වීමට කටයුතු සිදු කිරීම මඟින් අධ්‍යයන අංශයන්හි ප්‍රතිඵලයන් ජනගත කිරීම සාගර විශ්වවිද්‍යාලයේ විශාල ඉදිරි පියවරක පෙරමඟ සළකුණක් ලෙස සඳහන් කළ හැක. තවද, විශ්වවිද්‍යාලයේ දෙවන උපාධි ප්‍රදානෝත්සවය 2019.03.12 දින පවත්වන ලද අතර, ශ්‍රී ලාංකීය සංවර්ධන කාර්යභාරය සඳහා වෘත්තීය නිපුණ උපාධිලාභීන් දායක කිරීම මෙමඟින් සිදුකර තිබුණි.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ සුවිශේෂී සංධිස්ථානයක් සටහන් තබමින් තෘතීයික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා ධීවර හා නාවික ක්ෂේත්‍ර අධ්‍යාපනය ලබාදීම පිළිබඳව ජාතික වෘත්තීය පුහුණු විශිෂ්ඨතා සම්මානයෙන් පිදුම් ලැබීම වසර තුළ ලද ජයග්‍රහණයක් ලෙස සළකමි. වෘත්තීය පුහුණු අංශයේ පානදුර ප්‍රාදේශීය මධ්‍යස්ථානය ඉදිකිරීම් අවසන් අදියර අවස්ථාවක පැවැති අතර, මට්ටක්කුලිය සහ තංගල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයන් සඳහා **ISO**9001 -2015 තත්ත්ව සහතික ලබාගැනීම සිදුකර තිබුණි. ජලජීවී වගාව සහ මුහුදු ආහාර සැකසුම් තාක්ෂණය පිළිබඳ උපාධිය සඳහා ජාතික තත්ත්ව සහතික මට්ටම් 7 සඳහා විෂය මාලා සකස් කිරීමේ මූලිකත්වයට වෘත්තීය පුහුණු අංශය ක්‍රියාත්මක වී ඇත.

විශ්වවිද්‍යාලයීය කළමනාකරණ පද්ධතිය තුළ පවත්නා දෝෂ සහගත තත්ත්වයන් මහහරවා ගැනීම සඳහා අභ්‍යන්තර විගණිත ක්‍රියාමාර්ග ඵලදායි සේවාවක් සපයා තිබූ අතර, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් වසර තුළදී ලබාදීම සඳහා ඒය ඉවහල් වී ඇති බව පෙනේ.

2019 වසරේ විගණිත මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව සළකා බැලීමේදී තත්ත්වාගණනය කළ මතයන් ලබා දී තිබුණි. ඒ අනුව, වසර තුළදී, රාජ්‍ය මුදල් ඵලදායි කාර්යභාරයක් සඳහා යෙදවී ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

2019 වසරේ හඳුනාගත් ගැටළු සහගත තත්ත්වයන් මගහරවා ගනිමින් විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයේ දායකත්වය මත විශ්වවිද්‍යාලයීය ක්‍රියාකාරකම් වඩාත් ඵලදායි මාවතකට අවතීර්ණ කිරීමේ කාර්යභාරය ඉදිරි වසර තුළදී ක්‍රියාත්මක කරන බව සටහන් තබමි.

මහාචාර්ය එන්.පී. රත්නායක
උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

02. පාලන මණ්ඩලය හා සංයුතිය

01. මහාචාර්ය එන්.පී. රත්නායක මහතා	උපකුලපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය(සභාපති)
02. කේ.ඩී.එන්. රංජිත් අශෝක මහතා	ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
03. එල්. සුරේඛා හේවගේ මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
04. එන්.බී.එම්. රණතුංග මහතා	අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ), ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
05.ඉංජිනේරු ඊ.ඒ.එස්.කේ. එදිරිසිංහ මහතා	සභාපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
06. ආර්.ඩී.එස්. කුමාරරත්න මහතා	අධ්‍යක්ෂ ජනරාල්, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
07. ආර්.එම්. විජේසිංහ බණ්ඩා මහතා	අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය අමාත්‍යාංශය, මුදල් දෙපාර්තමේන්තුව
08.රවී ජයවර්ධන මහතා	සභාපති, වෘත්තීය පුහුණු අධිකාරිය
09. ටී.කේ.ඩබ්.ටී.පී.ප්‍රේමරත්න මහතා	සහකාර අධ්‍යක්ෂ, නගර සැළසුම් ජල සැපයුම් හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

03. ශාස්ත්‍රීය සභාව සහ සංයුතිය

01. මහාචාර්ය එන්.පී. රත්නායක මහතා (සභාපති)	උපකුලපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
02.හේමන්ත රත්නායක මහතා (ලේකම්)	ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
03. ආචාර්ය එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා	පීඨාධිපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
04. ආචාර්ය එච්.බී. ජයසිරි මහතා	පීඨාධිපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
05. ආචාර්ය චම්පා අමරසිරි මහත්මිය	උසස් අධ්‍යයන අංශ උපදේශිකා, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
06. නිශාන්ති සේපාලිකා මිය	උසස් අධ්‍යයන අංශ උපදේශිකා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
07. ආචාර්ය එම්.පී. කුමාර මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
08. ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
09. ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
10. එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
11. ඩී.එස්. මානගේ මහත්මිය	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
12. පී.යූ.අයි. පෙරේරා මහතා	අධ්‍යක්ෂ (පුහුණු) ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
13.එච්.කේ.ආර්. තුෂාර මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
14. දිලන්ත පෙරේරා මහතා	සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය කටයුතු) ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

04. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ආරම්භය, විකාශය හා අරමුණු

ශ්‍රී ලංකාවේ ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර දැනුම ලබා දී රටේ සංවර්ධනය උදෙසා දායකත්වය දීමේ කාර්යභාරය 2014 අංක 31 දරන පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ඉටු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය දක්වා වූ ගමනේ මූලාරම්භය සටහන් වනුයේ මීගමුව ප්‍රදේශයෙනි. 1963 වර්ෂයේදී මීගමුව ධීවර පුහුණු ආයතනය වශයෙන්ද, 1972 වර්ෂයේදී තංගල්ල, මඩකලපුව, යාපනය ප්‍රදේශ වලින් ආරම්භ වී 1975 වර්ෂයේ මට්ටක්කුලිය ද, 1993 වර්ෂයේදී ත්‍රිකුණාමලය ද ලෙස ධීවර පුහුණු මධ්‍යස්ථාන 06 ක ක්‍රමික විකාශයකින් පසු 1999 වර්ෂයේදී ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත මඟින් 1999 දෙසැම්බර් මස 20 වැනි දින සිට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය නමින් ස්ථාපිත වී 2006 වර්ෂයේදී ගාල්ල සහ 2008 වසරේදී කළුතර උතුර ප්‍රදේශයේ නව ධීවර හා නාවික ඉංජිනේරු විද්‍යාල 02 ක් ව්‍යාප්ත විය. මෙලෙස ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ ආවරණය වන අයුරින් දසත විහිදුන ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 ක වෘත්තීය පුහුණු අංශය වර්ධනය වී ඇති අතර පීඨ 02 කින් සමන්විත වූ උසස් අධ්‍යයන අංශය ද එකතුව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ශ්‍රී ලාංකික ධීවර ක්ෂේත්‍රයේ පුහුණු මානව සම්පත වර්ධනය කිරීමේ කාර්යභාරයේ පෙර ගමන්කරුවකු බවට පත් වී ඇත.

2001 වර්ෂයේදී උපාධි පාඨමාලා ආරම්භ වීමත් සමඟ 2003 වසරේදී ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී පාඨමාලාව ද, නාවික ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව සහ යාත්‍රා ගොඩනැඟීම් සහ නාවික නිර්මාණ ශිල්පි විද්‍යාවේදී පාඨමාලාව ද රජයේ පිළිගත් උපාධි පාඨමාලා වශයෙන් ගැසට් කර ප්‍රකාශයට පත් කරන ලදී.

2014 වසරේදී නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද, 2015 වසරේදී වෙරළ සහ සාගර සම්පත් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද ආරම්භ කරන ලද්දේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය තුල වාණිජ හා කලා ඇතුළු සියලු විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ සමත් වන සිසු දරු දරුදැරියන්ට වැඩි උපාධි අධ්‍යයන අවස්ථා ලබා දීමේ දොරටු විවර කර දෙමිනි.

1999 වසරේදී පිහිට වූ ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත අහෝසි කරමින් 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත සම්මත වූ අතර, 2015 වසරේදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස ස්ථාපනය වීමෙන් ශ්‍රී ලාංකික දුදරුවන්ට උසස් අධ්‍යයන වරම් සඳහා වැඩි ඉඩකඩක් විවෘත විය.

දැක්ම

ධීවර , සමුද්‍රීය විද්‍යාව සහ නාවික ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනයේ දකුණු ආසියාවේ නායකයෙකු බවට පත් වීම.

මෙහෙවර

ධීවර,නාවික සහ සමුද්‍රීය විද්‍යා ක්ෂේත්‍රයේ වර්තමාන හා අනාගත මානව සම්පත් අවශ්‍යතාවන් සපුරාලීම සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයන්ගෙන් යුත් අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

විශ්වවිද්‍යාලයේ අරමුණු

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 11 වන කොටසේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමේ අරමුණු පහත අයුරින් දක්වා ඇත.

01. ධීවර , සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම.

02. යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරභයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථා ලබා දීම.

03. ධීවර හා සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් අතර ධීවර, සමුද්‍ර සහ සමුද්‍රීය අංශවලට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම.

04. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම.

05. විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය සහ තාක්ෂණික පාඨමාලා සැපයීම.

06. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය සහ හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තීමය අධ්‍යාපනය සහ පුහුණුවීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැළැස්වීම.

07. ජාතික වෘත්තීයමය සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා අධ්‍යාපන පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම සහ ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම.

05. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යභාරය හා සේවා දායකත්වය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය උසස් අධ්‍යයන සහ වෘත්තීය පුහුණු ලෙස අංශ දෙකකින් ක්‍රියාත්මක වේ. පීඨ දෙකකින් සමන්විත උසස් අධ්‍යයන අංශයත්, මානව සම්පත් සංවර්ධන ක්‍රියාවලියේ නියමු මධ්‍යස්ථාන වශයෙන් ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 ක් ද වශයෙන් ඇතුළත් වෘත්තීය පුහුණු අංශයත් ශ්‍රී ලාංකික සංවර්ධන කාර්යභාරයට ලබා දෙන දායකත්වය පහත පරිදි වේ.

උසස් අධ්‍යයන අංශය

- ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨය
- ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය

වෘත්තීය පුහුණු අංශය

- **මීගමුව**
  ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,වැල්ලවිදීය, මීගමුව.
- **තංගල්ල**
  ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, මහවෙල පාර, තංගල්ල
- **මඩකලපුව**
  ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, නාවලඩි, මඩකලපුව
- **යාපනය**
  ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, දෙවන හරස් විදීය,ගුරු නගර්,යාපනය
- **මට්ටක්කුලිය**
  ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කාකදුපත, මට්ටක්කුලිය, කොළඹ 15.
- **ත්‍රිකුණාමලය**
  ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කොඩ්ඩෙ,චීන වරාය,ත්‍රිකුණාමලය
- **ගාල්ල**
  ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, මාගල්ල,ගාල්ල
- **කළුතර**
  ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, පාසල් පටුමඟ, දෙදියවල,වස්කඩුව, කළුතර

සේවා දායකත්වය

ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මානව සම්පත් සංවර්ධන කාර්යයන්හි දී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය මගින් පහත සඳහන් කණ්ඩායම් ආයතනයේ ඉලක්ක ගත කණ්ඩායම් ලෙස සලකා සේවා දායකත්වය සපයනු ලැබේ.

- ධීවර,සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රයන්හි නියැලී සිටින්නන්
- ධීවර , සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අලුතින් අවතීර්ණ වන්නන්
- ධීවර , සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අවතීර්ණ වීමට අපේක්ෂා කරන්නන්
- ධීවර, සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ විෂයයන් ඉගැන්වීම කරන ආචාර්ය මණ්ඩලය සහ උපදේශකවරු

06. උසස් අධ්‍යයන අංශය

සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශය මගින් ධීවර හා සමුද්‍රීය විද්‍යා, නාවික ඉංජිනේරු, වෙරළ සහ නාවික සම්පත් කළමණාකරණය , නාවික ප්‍රවාහනය සහ සැපයුම් කළමණාකරණය යන විද්‍යාවේදී උපාධි පාඨමාලා 05ක් ක්‍රියාත්මක වේ. ධීවර හා සමුද්‍රීය විද්‍යා උපාධිය තංගල්ල සහ සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය මට්ටක්කුලිය යටතේ ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨයෙහි පැවැත්වෙන අතර අනෙකුත් උපාධි පාඨමාලා මට්ටක්කුලිය ඉංජිනේරු හා කළමණාකරන පීඨයේ පැවැත්වේ. 2017 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය විසින් පවත්වන උපාධි පාඨමාලාවන් ගාස්තු අයකිරීමෙන් නිදහස් කර ඇත. නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හා ධීවර හා සමුද්‍ර විද්‍යාව විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා Z අගය (Z-Score) මත පදනම්ව ද නාවික ප්‍රවාහනය සහ සැපයුම් කළමනාකරණය විද්‍යාවේදී උපාධිය සහ වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණය විද්‍යාවේදී උපාධි පාඨමාලා, සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය සඳහා අභියෝග්‍යතා පරීක්ෂණ ප්‍රතිඵල මත ද ශිෂ්‍ය බඳවා ගැනීම් සිදු කර ඇත.

වගුව - අංක 1: වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය

විද්‍යාවේදී උපාධි වැඩසටහන්	ශිෂ්‍ය සංඛ්‍යාව							
	2012/ 2013	2013/ 2014	2014/ 2015	2015/ 2016	2016/ 2017	2017/ 2018	2018/ 2019	2019/ 2020
නාවික ඉංජිනේරු (විද්‍යාවේදී උපාධිය: අවු: 04)	42	40	27	26	40	31	37	47
ධීවර හා සමුද්‍රීය විද්‍යාව(විද්‍යාවේදී උපාධිය: අවු:03)	27	27	12	43	27	24	41	49
ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය (විශේෂ)	-	-	-	-	-	-	07	06
නාවික ප්‍රවාහන සහසැපයුම්කළමනාකරණය (විද්‍යාවේදී උපාධිය: අවු: 03)	-	40	30	30	47	41	53	53
වෙරළ සහ සාගර සම්පත් කළමනාකරණය (විද්‍යාවේදී උපාධිය: අවු:03)	-	-	17	12	40	31	45	55
සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය	-	-	-	-	-	-	20	26

වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය



<u>සිසුන් ආයතනික පුහුණුව සඳහා යොමු කිරීම</u>

ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨය මඟින් පවත්වනු ලබන උපාධි පාඨමාලා හදාරණ සිසුන් පාඨමාලාව අවසානයේදී ආයතනික පුහුණුව සඳහා යොමු කරන අතර, එමගින් සිසුන් හට ක්ෂේත්‍රය හා සම්බන්ධ විවිධ ආයතනයන් සමග සම්බන්ධ වී කටයුතු කිරීමට හැකියාව ලැබේ. ඒ අනුව, ආයතනික පුහුණුව දෙනු ලබන ආයතන කිහිපයක් පහත දක්වා ඇත.

රාජ්‍ය ආයතන	පෞද්ගලික ආයතන
• ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය • නාරා ආයතනය • සමුද්‍රීය පාරිසරක ආරක්ෂණ අධිකාරිය • ශ්‍රී ලංකා පරමාණු බලශක්ති අධිකාරිය • ශ්‍රී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව • වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව • මධ්‍යම පරිසර අධිකාරිය • ශ්‍රී ලංකා රේගුව • ශ්‍රී ලංකා වරාය අධිකාරිය • ආරක්ෂක අමාත්‍යාංශය • ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය • ධීවර දෙපාර්තමේන්තුව • පශු වෛද්‍ය පීඨය • ශ්‍රී ලංකා තත්ත්වසහතික ආයතනය (SLSI)	• රයිගම් මා ර්කටින් • ඇල්ෆෙක්ස් මැරීන් ආයතනය • සිලෝන් සීවීඩ් පුද්ගලික සමාගම • ලංකා ඇක්වා ප්ලාන්ට් සමාගම • පී එන් ප්‍රනාන්දු සහ සමාගම • සදර්න් සීෆුඩ් ආයතනය • මාස් හෝල්ඩින්ස් • රුවනි ඇක්වා ප්ලාන්ට් • මාස්ටර් ඩයිවර්ස් • බ්ලූ රිසෝස් ට්‍රස්ට් • ඕෂන්පික් පුද්ගලික ආයතනය (Ocean pick)

වගුව අංක 4 - ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ධීවර හා සාගර විද්‍යා පීඨයේ ආචාර්‍ය්‍ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්

1. ආචාර්ය එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා - B.Sc., (Ruhuna SL), M.Phil, (Ruhuna SL), Ph.D. (Shizuoka, Japan)
2. ආචාර්ය එම්. පී. කුමාර මහතා - B.Sc.(Hons), (Ruhuna,SL), Ph.D (Edinburgh Napier, UK)

කථිකාචාර්යවරු

1.ටී.ඩබ්.එස්. වර්ණසූරිය මහතා - **B**.Sc.(Hons), (Ruhuna,SL)), M.Sc.(Colombo, SL)

2. එන්. පී. ජී. පුෂ්පිත මහතා - B.Sc., Mphil (Ruhuna,SL)

3.ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී.එල් වික්‍රමසිංහ මිය - B.Sc. (Hons) (Ruhuna, Sri Lanka), M.Sc. (Vrije, Belgium) Ph.D.(ICAR-CIFE, Mumbai,India)

4.එස්. එන්. දුෂානි මිය - B.Sc.(Hons), (Ruhuna,SL)), M.Sc.(Tromso, Norway)

5.බී.ඒ. එන්. ඉන්දිකා මිය - B.Sc.(Hons), (Ruhuna,SL), M.Sc. (Reading)

6. ඩබ්. ඒ. ඒ. යූ. කුමාර මහතා - B.Sc.(Hons), (Ruhuna,SL), M.Sc. (James Cook, Australia)

7. එරන්දි පතිරණ මිය - B.Sc (Peradeniya, SL), M.Sc (Osaka, Japan), DCSD (NIBM,SL)

8. එම්. අයි. යූ. මානික්කආරච්චි මිය- B.Sc.(Hons), (Ruhuna,SL)

9. ඒම්.ටී.ජී. රත්නසූරිය මහතා -B.Sc.(Hons), (Ruhuna,SL), M.Sc (Pahyoug National University , Korea)

10. ඩබ්.ඒ. ශිරාන් වාමික මහතා - B.Sc (Hons), (Ocean University, SL)

වගුව අංක 5 -ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ නාවික ඉංජනේරු හා කළමනාකරණ පීඨයේ ආචාර්‍ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්

1. ආචාර්ය එච්.බී.ජයසිරි මහතා- B.Sc. in Biological Science (Ruhuna,SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (CIFE, Mumbai, India)
2. ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා - B.Sc. in Physical Science (Peradeniya,SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (Peradeniya,SL)
3. එස්.පී.යූ. ජිනදාස මහතා- B.Sc. in Special in Geology (Peradeniya,SL), (Mphil) Applied Geophysics (Open University Sri Lanka)

කථිකාචාර්යවරුන්

1. එම්.සී.එල් .සොයිසා මිය - B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management at Kelaniya, SL)
2. ඊ.ඒ.කේ.කේ. අමරසේකර මෙය - B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management at Kelaniya, SL)
3. ඒවි.ඒ.පි.ඒස්. ජයපාල මහත්මිය - B.Sc. in Degree (Open University of SL), m.Sc. in Fisheries & Aquatic Resources Management (Sri Jayawardhanapura, SL)
4. පී.ඒ.එස්.ඒ. රත්නශ්‍රී මිය - B.Sc. (Special) in Aquatic Science (Sri Jayawardhanapura, SL),
5. ඒ. අරුල්නායගම් මිය - B.Sc. (Special) in Environmental Sciences ,Vauniya Campus of the (University of Jaffna, SL), M.Sc. in Environmental Science (Peradeniya, SL)
6. ඩී.සී.මාන්නගේ මිය - B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), MBA in Management & Finance (Reading)
7. එච්. ඩී.එම්.එම්.පුස්සැල්ල මිය - B.Sc. (Hons) in Business Administration (Peradeniya,SL)
8. නලින් ද අල්විස් මහතා - B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), MBA in Management & Finance (Reading)
9. එම්.ජේ.එම්.ඒ. රාසුල් මහතා - B.Sc. in (Ruhuna,SL), MSc. (Agder,Norway)
10. පී.ඩී.ඩී. හර්ෂප්‍රිය මහතා - B.Sc. in Ocean University of Sri Lanka
11. ඒ.එච්.එස්.අයි. වීරකෝන් මහතා - B.Sc. in Ocean University of Sri Lanka

ප්‍රගතිය

01. විශ්වවිද්‍යාලයේ දෙවන උපාධි ප්‍රදානොත්සවය 2019 මාර්තු මස 12 වන දින පැවැත්වුන අතර, ඒහිදි උපාධිධාරීන් 109 ක් සඳහා පිරිනමන ලදී.

02. උපාධි පාඨමාලා සඳහා ආයතනික හා විෂය සමාලෝචනය කිරීමේ කටයුතු ඇරඹීම. (UGC Reimburse)

03. ගොඩනැගිලි 02ක් අලුත්වැඩියා කර රසායනාගාර පහසුකම් දියුණු කිරීම. (Fish anatomy lab and Geographical Information system lab)

04. නාවික ඉංජිනේරු හා කළමනාකරණ පීඨය සහ ධීවර හා සමුද්‍ර පීඨය සඳහා පීඨාධිපතිවරුන් පත්කිරීම සහ උපාධි පාඨමාලා සඳහා අංශාධිපතිවරුන් පත්කිරීම.

05. විශ්වවිද්‍යාල ප්‍රථම පර්යේෂණ සමුළුව (First Research Symposium) 2019.12.19 දින පැවැත්වීම.

06. මාසික විෂයානුබද්ධ දේශණ මාලා පැවැත්වීම.

07. සාගර විශ්වවිද්‍යාලීය පුවත්පත් සඟරාව මාසිකව එළිදැක්වීමට කටයුතු කිරීම.

08. සිසුන්ගේ පර්යේෂණ කටයුතු නගා සිටුවීම හා දියුණු කිරීම සඳහා නවීන පහසුකම් සහිත උපකරණ රසායනාගාර සඳහා සපයා දීම.

09. දේශනශාලා පහසුකම් දියුණු කිරීම සඳහා කටයුතු කිරීම. මේ අනුව දේශන ශලා සඳහා වායුසමීකරණ යන්ත්‍ර හා නවීන තාක්ෂණයෙන් යුතු Smart screen සවි කිරීමට හැකිවීම.

<u>ක්‍රීඩා කටයුතු හා සමාජීය ක්‍රියාකරකම්</u>

සිසුන්ගේ ක්‍රීඩා කෞශලයන් හා සහයෝගීතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා සැහැල්ලු පන්දු හා අත්පන්දු තරඟාවලියන් සංවිධානය කිරීම.

- OPL 2020 ක්‍රිකට් තරඟාවලිය
- ශිෂ්‍ය කණ්ඩායම් අතර අත්පන්දු තරඟාවලියන් පැවැත්වීම
- වෙසක් උත්සවයට සමගාමීව මෝක්ෂ ධාරා වැඩසටහන සංවිධානය කිරීම. මෙහිදී ප්‍රදේශයේ ප්‍රජාව සම්බන්ධ කරගනිමින් ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම, දන්සැලක් දීම,ධර්ම දේශනාවන් පැවැත්වීමට කටයුතු කිරීම.
- Bech Fest උත්සවය හා ඊට සමාගාමීව සරුංගල් සැණකෙලියක් පැවත්වීම.

<u>පාසල් හා සමාජ දැනුවත් කිරීම්</u>

- වෙරළ හා සාගර පරිසරය පිළිබඳ ගුරුවරු දැනුවත් කිරීමේ වැඩසටහන
- අ:පො:ස සා/පෙල විභාග සඳහා සාගර විශ්වවිද්‍යාල සිසුන් විසින් සම්මන්ත්‍රණ පැවැත්වීම.
- ජාත්‍යන්තර පරිසර රැක ගැනීමේ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබා දීම.

ජාත්‍යන්තර සහයෝගීතාවයන්

01. KOICA ව්‍යාපෘතිය යටතේ සාගර විශ්වවිද්‍යාලය ගොඩනැඟීම සඳහා ශක්‍යතා වාර්තාවක් පිළියෙල කිරීම.

02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු (Sally Ride යාත්‍රාව) මගින් ඉන්දියාවේ බෙංගාල බොක්ක ප්‍රදේශයේ සමුද්‍රීය කටයුතු පිළිබඳ පර්යේෂණ සඳහා සහභාගී කරවීම.

03. චීනයේ පවත්වන ලද සී බිලූ පුහුණු වැඩ සටහන සඳහා නාවික, ප්‍රවාහන හා කළමනාකරණ පාඨමාලාව හදාරන සිසුන් සහභාගී කරවීම.

04. කොරියාවේ පවත්වන ලද පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන (Student Research and Development – AMFUS Peace Forum Course) සඳහා නාවික, ප්‍රවාහන හා කළමනාකරණ පාඨමාලාව හදාරන සිසුන් දෙදෙනෙකු සහභාගී කරවීම.

05. කොරියාවේ පවත්වන ලද " Annual Forum of AMFUF (Asia Maritime and Fisheries Universities Forum) වැඩසටහන සඳහා සාගර විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් උපකුලපතිතුමා සහභාගී වීම.

06. ශ්‍රී ලංකා චීන පර්යේෂණ සහයෝගීතාව ස්ථාපනය කිරීම.

07. ධීවර, නාවික කටයුතු හා පොලිතීන් සම්බන්ධ දූෂණ පිලිබඳ පර්යේෂණ පත්‍රිකා 05 ක් ඉදිරිපත් කිරීම.

08. පර්යේෂණ ඒළිදැක්වීම පිළිබඳ පවත්වන ලද සම්මන්ත්‍රණයේදී පර්යේෂණ 08 ක තොරතුරු එළි දැක්වීම.

7. පුහුණු අංශය

2019 වර්ෂය තුලදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය පුහුණු අංශය යටතේ ප්‍රාදේශීය විද්‍යාලය 08ක් තුල පවත්වන ලද පාඨමාලා ප්‍රගතිය පහත දැක්වේ.

	නිපුණතා මට්ටම (NVQ/ NON NVQ)	බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව	සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව	පාඨමාලා හැරගිය ශිෂ්‍ය සංඛ්‍යාව	2020 වසර දක්වා
ධීවර හා ජලජීවී වගාව	NVQ	594	105	69	420
	Non	733	534	39	160
තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන	NVQ	185	16	11	158
	Non	0	0	0	0
සමුද්‍රීය හා නාවික විද්‍යාව	NVQ	278	25	32	221
	Non	61	53	8	0
වෙනත් (ජංගම)	NVQ	0	0	0	0
	Non	1393	1393	0	0



ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය මධ්‍යස්ථාන



පාඨමාලා සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හී ශිෂ්‍ය සහභාගීත්වය



	මීගමුව	යාපනය	මට්ටක්කුලිය	ගාල්ල	ත්‍රිකුණාමලය	මඩකලපුව	කළුතර	තංගල්ල
ඩිප්ලෝමා	95	27	32	28		32	25	20
සහතිකපත්‍ර	283	153	62	66	105	234	84	240
ජංගම පුහුණු	294	86	183		36			20
එකතුව	672	266	277	94	141	266	109	280

2019 වර්ෂයේදී ලබාගත් ජයග්‍රහණයන් පහත පරිදි වේ.

❖ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ මිලියන 124ක වියදමින් මහල් 04ක ගොඩනැගිල්ලක් 2017 වසරේ ඉදිකිරීම ආරම්භ කරන ලද අතර 2019 වර්ෂය අවසන් වනවිට 98%ක වැඩ අවසන් කර ඇත.



❖ ජාතික හා පළාත් මට්ටමින් මධ්‍යම මට්ටමේ රජයේ ආයතනයක ජාතික වෘත්තීය පුහුණු විශිෂ්ටතා සම්මානය - 2019 සඳහා පළමු ස්ථානය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ යාපනය ප්‍රාදේශීය විද්‍යාලයට හිමි විය.



❖ පාඨමාලා අවසානයේ ප්‍රාදේශිය විද්‍යාල මඟින් රැකියාගත පුහුණු ආයතන සඳහා සිසුන් අනුයුක්ත කිරීම.

❖ NVQ 5 මට්ටමේ සිට NVQ 6 සහ NVQ 7 යන මට්ටම් දක්වා පාඨමාලා සංවර්ධනය කිරීම

❖ මධ්‍යස්ථාන සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධති (Quality Management System -QMS) හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම තුල විධිමත් කළමණාකරනයකින් යුතු ඵලදායී සේවාවක් අභ්‍යාසලාභීන්ට ලබා දීමට ක්‍රියා කිරීම.

❖ දිවයින පුරා සිටින බහුදින ධීවර යාත්‍රා නියමුවන් 579ක් සඳහා ධීවර යාත්‍රා නියමු පුහුණුව ලබා දීම.

❖ මට්ටක්කුලිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා වෑද්දුම් වැඩහලක් ඉදිකිරීම.

❖ ජලජීවී වගාව සහ මුහුදු ආහාර සැකසුම් තාක්ෂණය පිළිබඳ උපාධිය සඳහා ජාතික තත්ත්ව සහතික මට්ටම් 7 සඳහා විෂය මාලා සකස් කිරීම.

❖ බහුදින ධීවර යාත්‍රා නියමුවන් සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ජාත්‍යන්තරව පිළිගත් ධීවර යාත්‍රා නියමු සහතිකය ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින් ලබාදීමට කටයුතු කිරීම.

<u>ශිෂ්‍ය සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග</u>

❖ ධීවර ප්‍රජාව පාඨමාලා පිළිබඳ දැනුවත් කර ඔවුන්ගේ දරුවන්ට පාඨමාලා හැදෑරීමට අවකාශ සලසා දීම.

❖ දිවයින පුරා විසිර සිටින සේවා අපේක්ෂිතයින් දැනුවත් කිරීම සඳහා පුවත්පත්,රූපවාහිනී සහ විද්‍යුත් මාධ්‍යයන් ඔස්සේ පාඨමාලා පිළිබඳ විස්තරාත්මක තොරතුරු පල කිරීම මඟින් පාඨමාලා සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීමේ වර්ධනයක් ඇති කිරීමට ක්‍රියා කිරීම.

❖ ප්‍රාදේශීය මධ්‍යස්ථාන විසින් තම බල ප්‍රදේශයන්ට අයත් රාජ්‍ය පාසල් වල සිසුන්, ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

❖ ප්‍රාදේශියව සහ ජාතික මට්ටමේප්‍රදර්ශන වෙනුවෙන් ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කිරීම මගින් ජනතාව දැනුවත් කිරීම.

8. පාලන අංශය

<u>පාලන අංශය යටතේ ක්‍රියාත්මක උප අංශයන්ගේ ප්‍රගතිය:</u>

<u>මානව සම්පත් අංශය</u>

විශ්වවිද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙයවර සාක්ෂාත් කර ගැනීමේ හා ඵලදායි කාර්යශූර කාර්ය මණ්ඩලයක් බිහි කිරීමේ අරමුණින්, අවශ්‍ය පුහුණු පාඨමාලාවන් සඳහා යොමු කිරීම සිදු කෙරෙන අතරම, මනා විනය පද්ධතියකින් ද යුක්තව සේවක මණ්ඩල කළමනාකරණය සිදු කරයි.

01. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට අවශ්‍ය කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම.

02. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ග්‍රහනය නොවූ කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීමට අදාළ යෝජනාවලිය සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

03. සේවකයන්ගේ ධාරිතාව වර්ධනයට අවශ්‍ය කටයුතු කිරීම.

04. පුහුණු අවශ්‍යතා සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම.

ඒ අනුව, 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා කාර්ය මණ්ඩලය පහත පරිදි දැක්විය හැකිය.

(අ.) කාර්ය මණ්ඩල විස්තර

කාර්ය මණ්ඩලය	වැටුප් කේතය	අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව	පවතින කාර්ය මණ්ඩලය			සත්‍ය කාර්ය මණ්ඩලය	ස්ථීර කාර්ය මණ්ඩල පුරප්පාඩු
			ස්ථීර	තාවකාලික	කොන්ත්‍රාත්		
අධ්‍යයන	UAC/Allowance	34	26	-	02	28	08
පුස්තකාල	U AC	03	0	0	0	0	03
පරිපාලන හා මූල්‍ය	U EX 3	02	02	0	0	02	00
අනෙකුත් විධායක	U EX 2/U EX 1	24	17	0	0	17	07
සෞඛ්‍ය							
අධ්‍යයන සහායක	U EX 1/U MN /AR 1	90	22	0	25	47	68
තාක්ෂණ නිලධාරී	U MT	18	07	0	0	07	11
කළමනාකරණ සහකාර	U MN	66	49	0	0	49	17
ප්‍රාථමික	U PL	98	79	0	0	79	19

(ආ.) අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර

පීඨය/ ප්‍රාදේශීය මධ්‍යස්ථානය	සේවක සංඛ්‍යාව				
	ජ්‍යෙෂ්ඨ	තෘතීය	ද්විතීය	ප්‍රාථමික	කොන්ත්‍රාත්
ධීවරහා සමුද්‍රීය විද්‍යා අංශය	11	00	08	02	00
සාගර විද්‍යා අංශය	02	00	00	00	00
ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය අංශය	00	00	00	00	00
ඉංජිනේරු හා කළමනාකරණ පීඨය	04	00	00	00	00
වෙරළසහ සාගර සම්පත් කළමනාකරණ අංශය	05	00	00	00	01
නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ අංශය	03	00	01	02	01

(ඇ) පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩල සහභාගීත්වය

පාඨමාලා	වැඩසටහන	දේශීය	විදේශීය	සහභාගී වූ සංඛ්‍යාව
පශ්චාත් උපාධි පාඨමාලා	KOICA Masters Fellowship Programme		✓	10
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	Ph.D Degree Programme		✓	01
උපාධි වැඩසටහන්				
ඩිප්ලෝමා වැඩසටහන්				
සහතික පත්‍ර වැඩසටහන්				
වෙනත් (සම්මන්ත්‍රණ/වැඩමුළු)	Labour Law and Disciplinary Procedures for Administrative Professionals	✓		01
	Social Security Laws	✓		03
	රජයේ නිලධරයන්ගේ B ගිණුම පිළියෙල කිරීම	✓		01
	Operation and Maintenance of Generators	✓		01
	විදුලි ජනක යන්ත්‍රෝපකරණ භාවිතය හා නඩත්තුව පිළිබඳ වැඩමුළුව	✓		01
	Employment conditions and Disciplinary Procedure from workplace to supreme court	✓		02
	දේපල/උපකරණ සම්බන්ධ ස්ථාවර වත්කම් පවත්වාගෙන යාම නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව	✓		01
	Duties and Responsibilities of Office Aides (KKS)	✓		05
එකතුව				**26**

ප්‍රගතිය

01. දෙවන උපකුලපතිවරයා ලෙස මහාචාර්ය නලීන් රත්නායක මහතා උපකුලපති ධුරයේ රාජකාරී භාර ගැනීම.

02. උසස් අධ්‍යයන කාර්යමණ්ඩල කථිකාචාර්ය තනතුරු සඳහා පුරප්පාඩු සම්පූර්ණයෙන්ම පිරවීම සඳහා කටයුතු සිදු කිරීම.

03. ප්‍රධාන නාවික ඉංජිනේරුවරයෙකු බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

04. අන්තර්ග්‍රහණයේදී ප්‍රමාදව තිබූ කාර්ය මණ්ඩල සාමාජිකයින් 41 කු සඳහා විශ්වවිද්‍යාල වැටුප් ක්ෙත ලබා දීම.

05. තනතුරු 32 ක් සඳහා විශ්වවිද්‍යාල පරිපාටිය කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

06. කථිකාචාර්යවරුන් 10 කු සඳහා කොරියානු විශ්වවිද්‍යාල 2 ක පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දීම.

8.2 ප්‍රවාහන අංශය

01. ගර්හිත තත්ත්වයේ පැවැති පහත සඳහන් රථවාහන 06 අපහරණය කිරීමේ කටයුතු වසර තුලදී සිදු කර ඇත.

මෝටර් රථ වර්ගය	වාහන අංකය
සුසුකි කැබ්	50-6189
ඉෂුසු ජර්නි බස් රථය	29-5410
හොන්ඩා යතුරු පැදිය	GL 0361
මිට්සුබිෂි ගැලන් මෝටර් රථය	17-3404
ඉෂුසු ජර්නි බස් රථය	29-5408
බජාජ් යතුරු පැදිය	146-6057

02. තංගල්ල විද්‍යාලයේ ගර්හිත තත්වයේ පවතින තවත් වාහන 02ක් අපහරණය කිරීමේ කටයුතු අවසන් කිරීම.

මෝටර් රථ වර්ගය	වාහන අංකය
ඉෂුසු ජර්නි බස් රථය	29-5407
බජාජ් යතුරු පැදිය	146-6027

03. ප්‍රධාන කාර්යාලයේ පවතින වාහන 02ක් සඳහා අපහරණ කටයුතු සිදුකිරීම

මෝටර් රථ වර්ගය	වාහන අංකය
මිට්සුබිෂි පෙජරෝ ජීප්	64-5796
මිට්සුබිෂි ලොරි	42-1677

04. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය වෙත ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වාහන 06 ක් ලබාගැනීම.

මෝටර් රථ වර්ගය	වාහන අංකය
ලෑන්කෘෂර් ජීප් රථය	65-5278
සුපර් සැලූන්	KO-8665
කරීනා	KB-7104
ටාටා මිනි බස් රථය	NA 99673
බොලැරෝ කැබ් රථය	PA 7094
ලියානා රථය	KA 9810

05. ත්‍රීකුණාමලය ප්‍රාදේශිය විද්‍යාලය වෙත අනුයුක්ත කර ඇති 31-5324 ජීප් රථය අළුත්වැඩියා කිරීම.

06. තංගල්ල පීඨය වෙත තවත් වාහනයක් වන KB 0381මෝටර් රථය අනුයුක්ත කරීම.

9. අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශයේ දැක්ම

මූල්‍ය කටයුතු, පාලන කටයුතු හා සංවර්ධන ක්‍රියාකාරකම් හි පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතීන් පිළිබඳ අඛණ්ඩ හා ස්වාධීන ඇගයීමක් පවත්වා ගෙන යමින්, එකී ක්‍රියාවලියට සම්බන්ධ වී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් නිර්දේශ කිරීම මඟින් යහපාලනය අර්ථවත් කිරීම සඳහා දායකවීම.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන්

- ❖ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ක්‍රියාකාරීත්වයන් සාර්ථක දැයි සෙවීම.
- ❖ නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
- ❖ කාර්ය මණ්ඩලයේ පැවරුම් කාර්යන් ඉටුවේ දැයි සෙවීම.
- ❖ වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ඇත්තේ දැයි සෙවීම.
- ❖ නීති රීති ක්‍රියාපටිපාටි අනුගමනය කරන්නේ දැයි සෙවීම.
- ❖ නාස්තිය, දූෂණය, අනවශ්‍ය වියදම් වැළැක්වීමේ පාලන ක්‍රම පවතින්නේ ද යන්න සෙවීම.
- ❖ වත්කම් අරපිරිමැසුම් දායකව පරිහරණය කරන්නේ ද යන්න විමසීම.
- ❖ විශේෂ විමර්ශන පැවැත්වීම.
- ❖ කළමනාකරණ දෘෂ්ටිකෝණයෙන් මෙහෙයුම් කටයුතු පිරික්සීම.
- ❖ ඉලක්ක සාධකයන් විමසීම.

දිවයිනේ අනෙකුත් විද්‍යාල සියල්ල ආවරණය වන පරිදි විගණන හා විමර්ශන රාජකාරී කටයුතු සිදු කෙරෙමින්, ආයතනයේ මූල්‍ය හා පරිපාලනය නිවැරදි මාවතක් කරා මෙහෙයවීම ද අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කෙරේ.

විගණන අංශයේ ප්‍රගතිය

- ❖ අභ්‍යන්තර විගණන වැඩ සැලැස්ම තුළ ක්‍රියාත්මක කිරීම.
- ❖ අභ්‍යන්තර විගණන විමසුම් 18 ක් සම්පාදනය කිරීම හා එහි ප්‍රගති කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ❖ විගණන කළමනාකරණ කමිටු පවත්වා ආයතනය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් සමාලෝචනය කිරීම.

අභ්‍යන්තර විගණන විමසුම්



ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		2019		2018	
	සටහන	රු.		රු.	
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ, පිරියත හා උපකරණ	9	648,762,979		592,759,143	
			648,762,979		592,759,143
ස්ථාවර තැන්පතු		4,593,819			
ජංගම වත්කම්			4,593,819		
සේවක ණය	10	13,167,510		12,540,685	
ඉන්වෙන්ට්රි	11	1,422,223		1,799,717	
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ	12	32,654,272		77,829,168	
අවිනිශ්චිත ගිණුම		85,433		85,433	
මුදල් හා මුදල් සමාන දේ	14	15,589,028	62,918,466	15,749,150	108,004,153
මුළු වත්කම			716,275,264		700,763,296
ස්කන්ධය සහ වගකීම්					
ප්‍රාග්ධන හා සංචිත	15	3,576,819			
සමුච්චිත අරමුදල	15.1	822,051,587		830,564,132	
සමුච්චිත අරමුදල ආංශික සංවර්ධන වැඩසටහන	15.2	239,045,854		201,422,283	
සමුච්චිත අතිරික්තය / (ඌණතාවය)	16	(514,416,548)		(445,391,295)	
			550,257,712		586,595,120
ජංගම නොවන වගකීම්					
විලම්බිත ආදායම					
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		63,379,169	63,379,169	45,331,680	45,331,680
ජංගම වගකීම්					
උපචිත වියදම්	17	83,644,548		55,834,256	
ගෙවිය යුතු වියදම්	18	18,993,833	102,638,380.7	13,002,239	68,836,495
මුළු වගකීම්			**716,275,264**		**700,763,296**

M. K. KAHAWITA
DIRECTOR FINANCE
Ocean University Of Sri Lanka
Crow Island, Mattakkuliya,
Colombo 15.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

		සටහන	2020	2019
මෙහෙයුම් ආදායම			රු	රු.
රජයේ ප්‍රදාන			325,340,000	309,048,000
වෙනත් ආදායම්		**1**	4,617,034	11,575,725
ආංශික සංවර්ධන අංශය- පුනරාවර්තන ප්‍රදාන			4,177,597	5,260,073
මෙහෙයුම් ආදායම			334,134,631	325,883,797
ක්‍රමක්ෂය කිරීමෙන් විලම්බිත ආදායම			71,119,936	59,520,683
			405,254,567	385,404,480
මෙහෙයුම් වියදම්				
පුද්ගලික නඩත්තු වියදම්		**2**	265,576,275	223,470,891
ගමන් වියදම්		**3**	3,136,345	2,733,151
සැපයුම් සහ පරිභෝජන		**4**	8,607,415	8,946,878
නඩත්තු වියදම්		**5**	5,282,355	5,127,480
ගිවිසුම්ගත සේවාවන්		**6**	78,052,964	67,556,151
පුහුණු වියදම්		**7**	20,779,816	19,709,580
වෙනත්		**8**	4,448,977	3,356,208
වාර්ෂික ක්ෂය		**9**	71,119,936	59,520,686
මුළු වියදම			**457,004,082**	**390,421,024**
ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)			**(51,749,516)**	**(5,016,544)**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2019 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය

රු.

	රජයේ ප්‍රදාන	ආංශික සංවර්ධන අංශ ප්‍රදාන	ප්‍රාග්ධන සංචිත	සමුච්චිත අතිරික්තය (ඌණතාවය)	එකතුව
2018/01/01 දිනට ශේෂය	**749,318,173**	**166,331,014**		**(435,126,654)**	**480,522,533**
වාර්ෂික ලාභය				(5,016,544)	(5,016,544)
වාර්ෂික රජයේ ප්‍රදාන ලැබීම්		34,358,175			34,358,175
පෙර වර්ෂයේ ගැළපීම				(5,248,097)	(5,248,097)
වාර්ෂික රජයේ ප්‍රදාන ලැබීම්	**136,159,250**	**39,698,660**			175,857,910
විලම්භිත ආදායම	(54,913,291)	(4,607,391)			(59,520,682)
2018/12/31 දිනට ශේෂය	**830,564,132**	**201,422,283**		**(445,391,295)**	**586,595,120**
වාර්ෂික ලාභය				(51,749,516)	(51,749,516)
සේවක ප්‍රතිලාභ මත තත්‍ය (අලාභය) / ලැබීම්				-	-
පෙර වසර ගැළපුම				(17,275,737)	(17,275,737)
ප්‍රාග්ධනය හා සංචිත			3,576,819		
වර්ෂය තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන	58,000,000	42,230,962			100,230,962
විලම්භිත ආදායම	(66,512,545)	(4,607,391)			(71,119,936)
2019/12/31 දිනට ශේෂය	**822,051,587**	**239,045,854**	**3,576,819**	**(514,416,548)**	**550,257,713**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එකාබද්ධ අරමුදල් ප්‍රවාහය

	31/12/2019	**31/12/2018**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇති වූ මුදල් ප්‍රවාහය		
සාමාන්‍ය ක්‍රියාකාරකම් තුලින් සිදු වූ ඌනතාවය සහ අතිරික්තය	(51,749,516)	(5,016,544)
මුල්‍ය නොවන හැසිරීම්		
ප්‍රාග්ධන අරමුදල් - ගැළපීම	-	38,495,591
පාරිතෝෂික දීමනා	20,223,914	12,294,349
ක්ෂය කිරීම්	71,119,936	59,520,686
පෙර වර්ෂයේ ගැළපීම්	(17,275,737)	23,324,267
-PPE ගැලපීම්	23,105,810	
ක්‍රමක්ෂය	(71,119,936)	(59,520,686)
	(25,695,529)	69,097,663
කාරක ප්‍රාග්ධනය වෙනස් කිරීමට පෙර මෙහෙයුම් ලාභය		
ඉන්වෙන්ට්‍රි වැඩිවීම	377,495	(775,028)
ලැබිය යුතු ශේෂ අඩුවීම	44,548,071	(15,055,206)
ගෙවිය යුතු වියදම් අඩුවීම	33,801,886	(21,962,106)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය කරන ලද මුදල්	78,727,452	(37,792,341)
පාරිතෝෂික ගෙවීම්	(2,176,426)	(738,258)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ක්ෂද්‍ර මුල්‍ය ප්‍රවාහය	(2,176,426)	(738,258)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා යෑම		
දේපළ පිරියත, සහ උපකරණ අත්පත් කර ගැනීම	(4,593,819)	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ක්ෂද්‍ර මුල්‍ය ප්‍රවාහය	(150,229,582)	(155,443,039)
මුල්‍ය ක්‍රියාකාරකම්වලින් තුළින් සිදු වූ මුදල් ප්‍රවාහය	**(154,823,401)**	
සංචිත	3,576,819	
ප්‍රාග්ධන අරමුදල්	58,000,000	109,000,000
ප්‍රාග්ධන ප්‍රධාන (ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන)	42,230,962	28,362,319
මුල්‍ය ක්‍රියාකාරකම් තුළින් සිදුවූ මුල්‍ය ප්‍රවාහය	103,807,781	137,362,319
මුදල් හා මුදල් සමාන කිරීම් සඳහා ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	(160,123)	12,486,344
ආරම්භයේදී මුදල් සහ මුදල් සමානකම්	15,749,150	3,262,800
	15,589,027	**15,749,150**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
ගිණුම් සඳහා සටහන්
2019 දෙසැම්බර් 31 දිනට

		අයවැය ප්‍රතිපාදන - 2019	2019.12.31 දිනට	2018.12.31 දිනට
		(Rs)	(Rs)	(Rs)
සටහන 1	**වෙනත් ආදායම්**			
	ආපදා ණය පොළි		489,150	447,735
	අසංවිධිත ආදායම්		470,707	5,377,430
	<u>පාඨමාලා ගාස්තු</u>			
	උසස් අධ්‍යයන ආදායම		872,075	1,189,350
	විද්‍යාල ආදායම		190,173	4,216,632
	නේවාසිකාගාර/නිවාස කුලී ආදායම		297,912	344,578
	පාඨමාලා ගාස්තු - ධීවර යාත්‍රා නියමු පුහුණු කිරීම්		1,389,181	
	- ජංගම		702,836	
	- ටෙන්ඩර් ගාස්තු		5,000	
	- පර්යේෂණ			
	සමුළුව		200,000	
			4,617,034	11,575,725
සටහන 2	**පුද්ගල නඩත්තු වියදම්**			
	වැටුප් හා වේතන	95,330,000	104,046,584	96,794,028
	සේවක භාර අරමුදල	18,300,000	14,911,472	14,915,202
	සේවක අර්ථ සාධක අරමුදල	4,547,000	3,732,228	3,635,044
	වෙනත් දීමනා	97,163,000	99,422,269	76,052,977
	අතිකාල	7,200,000	9,048,724	6,237,748
	පාරිතෝෂික වෙන් කිරීම්	6,000,000	20,223,914	
	ආංශික සංවර්ධන අංශය - කාර්ය සාධනය මත ගෙවීම්		-	12,294,349
	බාහිර කථිකාචාර්ය ගාස්තු	16,800,000	14,191,084	13,541,544
		245,340,000	265,576,275	223,470,891
සටහන් 3	**ගමන් වියදම්**			
	දේශීය	1,800,000	2,970,493	2,065,289
	විදේශ	200,000	165,852	667,862
		2,000,000	3,136,345	2,733,151

සටහන් 4	**සැපයුම්**			
	ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා (සටහන 4.1)	2,500,000	4,111,537	4,891,849
	වාහන සඳහා ඉන්ධන සහ ලිහිසි තෙල්	4,000,000	3,976,349	3,587,865
	පිරිසිදු කිරීම සහ වෙනත් ද්‍රව්‍ය		78,668	93,568
	වෛද්‍ය සැපයුම්	600,000	440,861	373,597
		7,100,000	8,607,415	8,946,878
සටහන් 4.1	**ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා**			
	ආරම්භක ශේෂය		1,799,718	1,024,689
	එකතු කළා: වර්ෂය තුළ මිලදී ගැනීම්		3,734,042	5,666,876
	අඩු කළා: අවසන් ශේෂය		(1,422,223)	(1,799,717)
	වර්ෂය තුළ පරිභෝජනය		4,111,537	4,891,849
සටහන් 5	**නඩත්තු වියදම්**			
	වාහන	2,000,000	2,869,639	2,688,408
	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	500,000	1,117,555	979,917
	යන්ත්‍රෝපකරණ	500,000	785,055	152,269
	බෝට්ටු සහ යාත්‍රා	100,000		
	කාර්යාල උපකරණ	100,000	510,107	1,306,887
		3,200,000	5,282,355	5,127,480
සටහන් 6	**කොන්ත්‍රාත් සේවා**			
	දුරකථන	7,500,000	7,085,778	6,583,256
	තැපැල් ගාස්තු	500,000	276,795	263,670
	ප්‍රවාහනය	1,500,000	1,646,922	1,919,156
	විදුලි	8,000,000	7,942,468	6,746,526
	ජලය	2,000,000	2,284,009	2,296,599
	කුලී සහ ප්‍රාදේශීය බදු	19,000,000	33,966,374	24,348,087
	වෙනත්	100,000	500,482	2,096,271
	ආරක්ෂක ගාස්තු	13,500,000	16,321,948	14,076,633
	සනීපාරක්ෂක සේවය	5,052,000	8,028,187	7,805,493
	විගණන ගාස්තු	950,000	-	1,420,460
		58,102,000	78,052,964	67,556,151

සටහන් 7	**පුහුණු වියදම්**			
	පුහුණු ද්‍රව්‍ය			
	CTC විද්‍යායතන	4,500,000	4,586,055	8,646,297
	C.T.C. විශ්වවිද්‍යාලය	6,824,000	8,424,261	4,915,817
	ධීවර යාත්‍රා නියමු පුහුණු වියදම්		803,092	
	ජංගම පුහුණු වියදම්		378,910	
	ව්‍යාපෘති වියදම්			
	මානව සම්පත් ධාරිතා ගොඩනැඟීම	2,750,000	2,002,712	887,393
	පුනරාවර්තන වියදම් - ආංශික සංවර්ධන		3,218,437	5,260,073
	පර්යේෂණ සහ සංවර්ධනය	2,578,000	1,366,348	
		16,652,000	20,779,816	19,709,580
සටහන් 8	**වෙනත් වියදම්**			
	සේවක සුබසාධක	1,200,000	1,510,440	1,389,311
	විනෝදාස්වාදය	500,000	923,790	1,218,787
	පාලන මණ්ඩල ගාස්තු ගෙවීම්	600,000	364,017	450,677
	බැංකු ගාස්තු		26,615	36,534
	උපදේශන ගාස්තු	100,000	38,910	188,523
	නෛතික සහ වෙනත් දීමනා	500,000	1,583,905	52,583
	ආහාර සහ නිල ඇඳුම		-	19,794
	වෙනත්	34,000	1,300	-
		2,934,000	4,448,977	3,356,208

සටහන් 09- දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ

විස්තරය		2019.01.01 දිනට ශේෂය	වර්ෂය තුළ අත්පත්කර ගැනීම්	වර්ෂය තුළ ඉවත් කිරීම්	2019.12.31 දිනට ශේෂය
ඉඩම් හා ඉඩම් සංවර්ධනය	2105	7,939,174.75			7,939,174.75
ගොඩනැගිලි පුනරුත්ථාපනය	2001/01	140,468,025.06		(6,824,072.00)	133,643,953.06
මිලදී ගැනීම් - යන්ත්‍ර සුත්‍ර හා උපකරණ	2103	104,541,333.72	31,286,673.00		135,828,006.72
මිළදී ගැනීම්-ගොඩනැගිලි	2104	183,966,316.94	23,832,545.34		207,798,862.28
පුනරුත්ථාපනය - බෝට්ටු හා යාත්‍රා	2005/02	11,832,028.02			11,832,028.02
ධීවර ආම්පන්න උපකරණ	2107/02	37,273,126.17			37,273,126.17
ලී බඩු හා සවි කිරීම්	2102	102,741,879.49	4,400,206.49		107,142,085.98
නාම පුවරු	2106/02	1,459,114.80			1,459,114.80
පුස්තකාල පොත්	2107/03	26,007,045.38	184,548.60		26,191,593.98
වෙනත් වත්කම්	2106/00	8,267,273.72	383,300.00		8,650,573.72
පුනරුත්ථාපනය / වාහන	2003	22,713,970.61	1,301,495.62		24,015,466.23
පරිගණක	2103/03	31,211,625.93	2,114,375.40		33,326,001.33
මිළදී ගැනීම් - වාහන	2101	42,373,703.02			42,373,703.02
විද්‍යාගාර උපකරණ	2107/04	9,728,427.82			9,728,427.82
පුනරුත්ථාපනය- කාර්යාල උපකරණ	2004/00	2,951,207.32	85,488.00		3,036,695.32
පුනරුත්ථාපනය - යන්ත්‍රෝපකරණ හා උපකරණ	2002	2,715,688.56	604,808.67		3,320,497.23
මිලදී ගැනීම්- පුහුණු උපකරණ	2107	64,902,190.12	2,979,686.00		67,881,876.12
පුනරුත්ථාපනය- පුහුණු උපකරණ	2005/00	8,849,670.43			8,849,670.43
මීගමුව නේවාසිකාගාර ගොඩනැගිල්ල	2104/02	37,436,137.51			37,436,137.51
සභාපති කාර්යාල ගොඩනැගිල්ල	2104/03	20,185,385.00			20,185,385.00
යාපනය ගොඩනැගිල්ල	2104/03	27,646,398.62			27,646,398.62
විශ්වවිද්‍යාල ලෝගු			1,079,250.00		1,079,250.00
එකතුව	**(A)**	**895,589,410.56**	**68,252,377.12**	**(6,824,072.00)**	**957,017,715.68**

සටහන් - 09.01

විස්තරය	2019.01.01 දිනට ශේෂය	වර්ෂය තුළ අත්පත්කර ගැනීම්	වර්ෂය තුළ ඉවත් කිරීම්	2019.12.31 දිනට ශේෂය
සාගර විශ්වවිද්‍යාලය ප්‍රාදේශික මධ්‍යස්ථානය පානදුර ගොඩනැගිල්ල 2104-5	54,437,728.55	62,583,061.58		117,020,790.13
වැඩ ප්‍රගතිය බූස්ස ගොඩනැගිල්ල -2104-6	12,042,537.60	10,437,776.04		22,480,313.64
මට්ටක්කුලිය - වැඩහල් - 2104-6		6,681,033.40		6,681,033.40
JAICA ගොඩනැගිල්ල තංගල්ල 2104-9		1,722,803.24		1,722,803.24
තංගල්ල ශිෂ්‍ය නේවාසිකාගාරය		552,530.96		552,530.96
උප එකතුව (B)	**66,480,266.15**	**81,977,205.22**		**148,457,471.37**
එකතුව (A) + (B)	**962,069,676.71**	**150,229,582.34**	**(6,824,072.00)**	**1,105,475,187.05**

සටහන් 10	**සේවක ණය**		
	ආපදා ණය	12,872,045	12,206,667
	උත්සව අත්තිකාරම්	123,250	141,804
	පොත් ණය	750	750
	සුනාමි ණය	171,464	191,464
		13,167,510	12,540,685
සටහන් 11	**තොග 31/12/2019**		
	ලිපි ද්‍රව්‍ය	1,422,223	1,799,717
		1,422,223	1,799,717
සටහන් 12	**ලැබිය යුතු ශේෂය**		
	ආපසු ගෙවිය යුතු තැන්පතු (විදුලිබල NARA)	218,750	218,750
	ආපසු ගෙවිය යුතු තැන්පතු (වාහන කුලිය)	47,000	47,000
	අත්තිකාරම්	3,742,168	3,742,168
	නේවාසිකාගාර සඳහා තැන්පතු	1,713,000	1,708,500
	ලැබිය යුතු පාඨමාලා ගාස්තු - උසස් අධ්‍යාපනය	11,797,123	15,092,123
	වැටුප් අත්තිකාරම්	-	116,500
	ලැබිය යුතු නේවාසිකාගාර ගාස්තු - උසස් අධ්‍යයන	215,404	2,892,804
	අත්තිකාරම් ගෙවීම් ධීවර අමාත්‍යාංශය	930,593	930,593
	ආපසු ගෙවිය යුතු නේවාසිකාගාර ගාස්තු	110,000	110,000
	ගමන් වියදම් අත්තිකාරම්		15,000
	ඉන්ධන අත්තිකාරම්	18,635	18,635
	ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු (නාරා)	180,000	180,000
	නාරා ආයතනයට ආපසු ගෙවීම්	33,269	62,702
	ආපසු ගෙවිය යුතු තැන්පතු	124,920	126,920
	නේවාසිකාගාර තැන්පතු	400,000	400,000
	ගොඩනැඟිලි තැන්පතු - ලැබිය යුතු	5,750,000	18,400,000
	සුභසාධනය	10,500	10,500
	ලැබිය යුතු ප්‍රදාන - ආංශික සංවර්ධන අංශය	1,148,542	12,862,508
	අත්තිකාරම් ගෙවීම් පානදුර ගොඩනැඟිල්ල		18,841,101
	බුස්ස ගොඩනැඟිල්ල		2,053,364

	මට්ටක්කුලිය වැඩහල	1,631,936	
	ත්‍රිකුණාමලය ගොඩනැඟිලි	4,153,670	
	අත්තිකාරම් ගෙවීම බුස්ස ගොඩනැඟිල්ල		
	Stage 2	382,573	
	ස්ථාවර තැන්පතු- ලැබිය යුතු පොළි ආදායම	46,190	
		32,654,272	77,829,168
සටහන් 14	**අතැති මුදල්**	14,909,110	13,184,971
	බැංකුවේ මුදල් - මහජන බැංකුව -9868	679,919	2,564,179
	බැංකුවේ මුදල්- මහජන බැංකුව -9909	15,589,028	15,749,150
සටහන් 15	**ප්‍රාග්ධන සහ සංචිත**		
	විශ්වවිද්‍යාල පර්පාලන සංවර්ධන අරමුදල	1,192,273	
	උපකුලපති අරමුදල	596,135	
	විශ්වවිද්‍යාල පරිපාලන අරමුදල	1,788,411	
		3,576,819	
සටහන් 15.1	**සමුච්චිත අරමුදල**		
	ආරම්භක ශේෂය 2019.01.01	830,564,132	749,318,173
	එකතු කළා: රජයේ ප්‍රදාන	58,000,000	109,000,000
	භාණ්ඩාගාර ප්‍රතිපාදන		20,575,000
	ප්‍රදාන වලින් ප්‍රකාශිත ක්‍රමක්ෂය ගැලපීම	(66,512,545)	(54,913,291)
	අවසන් ශේෂය 2019.12.31	822,051,587	823,979,882
	වෙනත් ආයතන මඟින් ලද අරමුදල්		6,584,250
	සමස්ථ ප්‍රදාන	822,051,587	830,564,132
	SSDP-සමුච්චිත අරමුදල		
	ආරම්භක ශේෂය 2019.01.01	201,422,283	166,331,014
	ආංශික සංවර්ධන අංශය-සමුච්චිත අරමුදල	42,230,962	39,698,660
	ප්‍රදාන වලින් ප්‍රකාශිත ක්‍රමක්ෂය ගැලපීම	(4,607,391)	(4,607,391)
	අවසන් ශේෂය 2019.12.31	239,045,854	201,422,283
සටහන් 16	**සමුච්චිත අතිරික්කය / (ඌණතාවය)**		
	ආරම්භක ශේෂය(ඌණතාවය) 2019/01/01	(445,391,295)	(435,126,654)
	එකතු කළා: අතිරික්තය /(ඌණතාවය) වර්ෂය තුළ	(51,749,516)	(5,016,544)
	පෙර වර්ෂයේ ගැලපීම	(17,275,737)	(5,248,097)
	අවසන් ශේෂය 2019.12.31	(514,416,548)	(445,391,295)

සටහන් 17 උපචිත වියදම්

උපචිත වියදම්	83,644,548	55,834,256
	83,644,548	55,834,256

සටහන් 18 නැවත ගෙවිය යුතු වියදම්

රඳවා ගැනීම්	12,281,020	9,246,126
නැවත ගෙවිය යුතු තැන්පතු (ටෙන්ඩර් තැන්පතු)	107,200	461,826
නැවත ගෙවිය යුතු පුස්තකාල තැන්පතු	1,641,000	964,000
නැවත ගෙවිය යුතු - විද්‍යාගාර තැන්පතු	792,000	452,000
මුද්දර ගාස්තු		21,250
උපයන විට ගෙවීම්	24,365	3,090
ලැබිය යුතු	3,700	3,700
නැවත ගෙවිය යුතු නේවාසිකාගාර තැන්පතු	652,526	107,200
විගණන ගාස්තු	1,353,213	1,353,213
ණය භිමියන්ට ගෙවීම්	493,492	388,434
වෙනත්	1,400	1,400
උත්සව ණය - මහජන බැංකුව	300,468	
අත්තිකාරම් ගෙවීම් පානදුර ගොඩනැගිල්ල	1,343,450	
	18,993,833	13,002,239

11. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VTY/G/C/OUSL/2019/02

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2020 ජූලි 09 දින

උපකුලපති

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ පරෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් - 1. ලේකම් - උසස් අධ්‍යාපන, තාක්ෂණ හා තරවෝත්පාදන අමාත්‍යාංශය

2. ලේකම්- මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

+94 11 2 88 70 23 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naod.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VTY/G/C/OUSL/2019/02 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2020 ජූලි 07 දින

උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 51(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංග ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංග ගිණුම්කරණ ප්‍රමිත 03 ට අනුකූලව අස්පීත්වයන් විසින් පූර්ව කාලපරිච්ඡේදවලදී සිදු වී ඇති වැරදි නිවැරදි කිරීමේදී අතීතානුයෝගීව ගැලපීම් කර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවත් රු. 18,294,286 ක හර හා රු. 1,081,250 ක බැර අගයන් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමවල සාධාරණ වටිනාකම සැලකිය යුතු තරමේ වෙනස්වීම් ඇති විට සෑම වර්ෂ තුනකටම හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනයක් සිදුකල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ ශුද්ධ වටිනාකම රු.500,305,508 ක් වූ විශ්වවිද්‍යාලයේ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම ප්‍රමිතියේ 21 වගන්තියට පටහැනිව රු. 1,301,495 ක් වූ පුනරාවර්තන ස්වභාවයේ වාහන අළුත්වැඩියා හා නඩත්තු වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 53,925,596 ක් වූ වත්කම් අයිතම 02 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් එම වත්කම් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ත්‍රිකුණාමල විද්‍යාලයේ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරා තිබූ රු. 4,153,670 ක් ගොඩනැගිලි ගිණුමට හර කිරීම වෙනුවට අත්තිකාරම් ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එම වටිනාකමින් දේපල පිරියත හා උපකරණ වටිනාකම අඩුවෙන් හා අත්තිකාරම් ගිණුම් ශේෂය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබූ පෙර වර්ෂ වලට අදාල ඉදිකිරීම් දෙකක් වෙනුවෙන් ගෙවිය යුතු රු. 3,764,056 ක් නිරවුල් කිරීමේදී උපචිත වියදම් ගිණුම හර කිරීමෙන් වූ වරද නිවැරදි කිරීමේදී අදාල වත්කම් ගිණුම හර කිරීම වෙනුවට ඌනතා හා අතිරික්තතා ගිණුම හර කර තිබුණි.

(ඊ) ගිණුම් විෂයයන් 04 කට අදාල එකතු වටිනාකම රු. 49,989,268 වූ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම් සඳහා විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සාගර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි

කිරීම මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සාගර විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් නිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1)(ඇ)(III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සාගර විශ්වවිද්‍යාලය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මගේ අවධානයට ලක්නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සාගර විශ්වවිද්‍යාලයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනක්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත දැසඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
(අ) 2014 අංක 31 දරණ සාගර විශ්වවිද්‍යාල පනත	
(i) 10(1) හා 10(3) වගන්ති	විශ්වවිද්‍යාලය සඳහා කුලපතිවරයෙකු සහ "ඇතුලත් කිරීම් ප්‍රතික්ෂේප සහ තත්ව සහතික කිරීම් සභාව " සඳහා අධ්‍යක්ෂකවරයකු පත්කළ යුතු වුවත් විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම එම තනතුරු සඳහා නිලධාරීන් පත්කර නොතිබුණි.

(ii) 45 වගන්තිය	යම් මූල්‍ය වර්ෂයකට අදාලව වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික අයවැයගත මූල්‍ය ප්‍රකාශන (මූල්‍ය විසර්ජන) පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව එවැනි අයවැයගත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාගැනීමට අදාලව වැය ඇස්තමේන්තු පමණක් පිළියෙල කර තිබූ අතර මූල්‍ය ප්‍රකාශන සටහන් වල අයවැය ගත අගයන් ලෙස එම ඇස්තමේන්තුගත අගයන් දක්වා තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ මූදල් රෙගුලාසි 206 හා 565(2)	තැන්පතු ආපසු ගෙවීමේදී මූදල් රෙගුලාසි ප්‍රකාරව අනුගමනය කළයුතු විධිවිධාන අනුගමනය නොකළ අවස්ථා පැවතීම හේතුවෙන් යම් නිශ්චිත දිනකට එක් පුද්ගලයෙකුට / ආයතනයකට තවදුරටත් නිරවුල් කළයුතු තැන්පතු වටිනාකම හඳුනාගත නොහැකිවිය. එසේම තැන්පතු ලේඛන ද පවත්වා නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සාගර විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සාගර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

  - විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ පංතිකාමර හා ප්‍රශ්නකාල සඳහා භාවිතා කිරීමේ අරමුණින් 2017 දෙසැම්බර් සිට මාසික කුලිය රු. මිලියන 2.3 බැගින් වර්ග අඩි 16 800 ක පමණ වූ නව ගොඩනැගිල්ලක් කුලී පදනමට ලබාගෙන තිබුණි. මාසික කුලියට අමතරව එම ගොඩනැගිල්ලේ අභ්‍යන්තර සැකසීමේ කටයුතු සඳහා රු.මිලියන 22 ක් ද වැයකර තිබුණි. එහෙත් මේ තුළින් විශ්වවිද්‍යාලය සඳහා බදවාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවේ හෝ පවත්වනු ලබන උපාධි පාඨමාලාවන්ගේ වර්ධනයක් සිදුවී ඇති බව හඳුනාගත නොහැකි විය. එමෙන්ම එතෙක් විශ්වවිද්‍යාලය විසින් භාවිතා කළ ගොඩනැගිලි සංකීර්ණයෙන් වර්ග අඩි

11778 ක ප්‍රමාණයක් වර්තමානය වන විට නිශ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) (i) 2015 වර්ෂයේ උපාධි පාඨමාලා 04 ක් යටතේ 87 ක් වූ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වර්ෂය වනවිට 156 දෙනෙකු දක්වා වර්ධනය වී පැවතියද ඉන්පසුව ප්‍රමාණවත් වර්ධනයක් සිදුව නොමැති අතර 2019 වර්ෂය වන විට පාඨමාලා 05 ක් යටතේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 207 දෙනෙකු විය.

(ii) 2015 වර්ෂයේදී වෘත්තීය පාඨමාලා (NVQ) 12ක් යටතේ පාඨමාලා හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව වූ 466 ගි ප්‍රමාණවත් වර්ධනයක් සිදුව නොමැති අතර සමාලෝචිත වර්ෂයේදී එවැනි පාඨමාලා 14 ක් යටතේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 604 දෙනෙකු විය.

ඒ අනුව උපාධි පාඨමාලා හා වෘත්තීය පාඨමාලා සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් ලියාපදිංචි කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) විගණනයේදී සිදුකළ නියදි පරීක්ෂාවකට අනුව මට්ටක්කුලිය පීයේ උපාධි පාඨමාලාවන්හි පැය 674 ක් මගින් ආවරණය කළයුතු විෂයයන් 20 කට අදාළ දේශක වාර්තා පොත් 03 ක් විගණනයට ඉදිරිපත් නොකළ අතර ඉදිරිපත් කළ දේශක වාර්තා පොත්වලද විෂයයන් 08ක් යටතේ ආවරණය කළයුතු පැය 435 ක් සඳහා වූ තොරතුරු ඇතුලත් කර නොතිබුණි.එමෙන්ම සටහන් තබා තිබූ දේශක වාර්තා පොත් අනුව විෂයයන් 38 ක් යටතේ ආවරණය කළයුතු පැය 1854 න් ආවරණය කළ බවට සටහන් යොදා පැවතියේ පැය 1218 ක් සඳහා පමණක් විය. ඒ අනුව පාඨමාලා අන්තර්ගතය ආවරණය කිරීම වාර්තා කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් භුක්තිය දී තිබූ දේශක වාර්තා පොත් (Lecture Record Book) පිළිබඳව නිසි අධීක්ෂණයක් නොවීම , තොරතුරු අසම්පූර්ණ වීම වැනි අඩුපාඩු පැවති බව විගණනයේදී අනාවරණය විය.

(ඇ) විභාග වලට පෙනී සිටි සිසුන් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී මට්ටක්කුලිය පීයේ උපාධි පාඨමාලා යටතේ පැවැත්වූ විභාගවලින් ප්‍රතිඵල නිකුත් කරන ලද විෂයයන් 36 කට අදාලව ප්‍රථමවරට ප්‍රශ්න පත්‍ර 1306 කට මුහුණදීමට සිසුන් සුදුසුකම් ලබා තිබුණද ප්‍රශ්නපත්‍ර 924 ක් සඳහා පමණක් මුහුණ දී තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය සතුව එක් එක් පාඨමාලාවන් යටතේ විභාගවලට පෙනී සිටීමට සුදුසුකම් ලබන ශිෂ්‍ය සංඛ්‍යාව හා ඒ යටතේ විභාගවලට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව හඳුනාගැනීමට ක්‍රමවේදයක් නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) උපාධි පාඨමාලා යටතේ සති දෙකක් ඇතුලත උත්තරපත්‍ර පරීක්ෂා කර ඝනියක ඇගයීම් කාලයකින් පසුව විභාග ප්‍රතිඵල නිකුත්කිරීමේ ක්‍රමවේදයක් විශ්වවිද්‍යාලය විසින් භදුන්වාදී නිබුණි. මවටක්කුලිය පියයට අදාලව සමාලෝචිත වර්ෂයේ මැයි සහ ජූනි මාස වල පවත්වන ලද විභාග සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාව අනුව , කණ්ඩායම් 12ක විෂයන් 85 ක් යටතේ ප්‍රශ්නපත්‍ර 3036කට පෙනී සිටීමට සිසුන් සුදුසුකම් ලබා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කණ්ඩායම් 09 ක විෂයයන් 36කට අදාල පිළිතුරුපත් 924 ක් සඳහා පමණක් විභාග ප්‍රතිඵල නිකුත්කර නිබුණි. ඉතිරි ප්‍රශ්නපත්‍ර වලට සිසුන් පෙනී සිටි බවට තහවුරු කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් විශ්වවිද්‍යාලය අනුගමනය කර නොතිබුණි.

(ඉ) පාඨමාලා අන්තර්ගතය , බදවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව හා අධ්‍යයන කාර්ය මණ්ඩල කටයුතු ආදිය සඳහා නිර්නායක සැකසීමට විශ්වවිද්‍යාල පනතේ 23 වන වගන්තිය අනුව බලය පැවරී ඇති ඇතුලත්කිරීම් ප්‍රතීතන හා තත්ව සහතික කිරීම් සභාව විශ්වවිද්‍යාල අරමුණ වූ 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම වාර 03 ක් පමණක් රැස්වී ඇති අතර එකී වාර වලදීද විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ අත්තර්ගහන කටයුතු පිළිබඳ පමණක් සාකච්ඡාවට බදුන්වී නිබුණි.

(ඊ) 2014 අංක 31 දරන සාගර විශ්වවිද්‍යාල පනතේ 5.1 (25) වගන්තිය අනුව පිහිටුවිය යුතු Sea Training Vessel Maintenance ඒකකය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පිහිටුවා නොතිබුණි. යොදාගත හැකි 1994 සිට 2015 කාල පරාසය තුල මෙම ඒකකය සඳහා ලැබී තිබූ Inboard , Outboard සහ අධිවේගී බෝට්ටු ඇතුළු යාත්‍රා 13 ක් ප්‍රාදේශිය විද්‍යාල වල නිශ්කාර්යව හා උනෙ උපයෝගීතාව පැවතුනි.

(උ) මවටක්කුලිය පෙරේරා නේවාසිකාගාරය 2015 වර්ෂයේ ආපසු භාරදී ඇතත් ඒ වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් ලබාදී තිබූ රු. 840,000 අත්තිකාරම් මුදල නැවත ලබාගැනීමකින් තොරව ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා නිබුණි.

(ඌ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් යටතේ දිර්ඝකාලීනව පැවත එන නිරවුල් නොකරන ලද එකතු වටිනාකම් රු. 13,784,801 ක ශේෂ 09 ක් පැවතුණි.

(එ) අනුමත කාර්ය මණ්ඩලය 335 දෙනෙකු වුවද 2019 වර්ෂය අවසන් වන විට සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය 202 දෙනෙකු විය. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පූරප්පාඩු සංඛ්‍යාව 60 ක් හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ පූරප්පාඩු 78 ක් හා තනතුරු නාම 04ක් යටතේ අතිරික්තය 15 ක් විය.

(ඒ) උපාධි පාඨමාලා පැවැත්වෙන උසස් අධ්‍යාපන අංශයෙහි කථිකාචාර්යවරුන් යටතේ අනුමත කාර්ය මණ්ඩලය 31 දෙනෙකු වූ අතර 2019 වර්ෂය අවසානයට තනා කාර්ය මණ්ඩලය 25 දෙනෙකු විය. මීට අමතරව කොන්ත්‍රාත් පදනම් මත කථිකාචාර්යවරු 02 දෙනෙකුගේ හා බාහිර

කථිකාචාර්යවරුන් 67 දෙනෙකුගේ සේවය ලබාගෙන පිළිවෙලින් රු. 1,200,000 ක් හා රු. 5,468,025 ක් දිමනා ලෙස ගෙවීම් කර තිබුණි.

(ii) වෘත්තීය ශාඛාමාලා පැවැත්වෙන වෘත්තීය අධ්‍යාපන අංශයෙහි උපදේශකවරුන් යටතේ අනුමත කාර්ය මණ්ඩලය 74 දෙනෙකු වූ අතර 2019 වර්ෂය අවසානයට නතර කාර්ය මණ්ඩලය 18 දෙනෙකු විය. මීට අමතරව කොන්ත්‍රාත් පදනමට උපදේශකවරුන් 25 දෙනෙකු හා බාහිර උපදේශකවරුන් 79 දෙනෙකුගේ සේවය ලබාගෙන පිළිවෙලින් රු. 9,976,285 ක් හා රු.5,735,245 ක් දිමනා ලෙස ගෙවීමකර තිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

12. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

මගේ අංකය என் எண் My No	OCU/02/02/01-2019GA	ඔබේ අංකය உங்கள் எண் Your No	දිනය தினம் Date	2020 නොවැම්බර් 06

විගණකාධිපතිතුමා,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා සකස්කරන ලද පිලිතුරු වාර්තාව.

යොමුව: ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

01. උක්ත කරුණට අදාලව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව ඔබ විසින් අප වෙත යොමු කරණ ලද විස්තරාත්මක විගණකාධිපති වාර්තාව සඳහා සකස්කරණ ලද පිළිතුරු වාර්තාව .

02. ඔබගේ අවධානයට සහ කාරුණික දැනගැනීම් සඳහා මේ සමඟ ඉදිරිපත් කරමු.

මහාචාර්ය.එන්.පී.රත්නායක
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

මහාචාර්ය එන්.පී. රත්නායක
BSc (Hons.), MSc (Japan), PhD (Japan), (Cgoel)
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
කාක දූපත, කොළඹ 15.

පිටපත් -

01. විගණන සුපරීක්ෂක - ජාතික විගණන කාර්යාලය,
රජයේ විගණන අංශය කාර්මික අධ්‍යයන හා ප්‍රහුණු කිරීමේ
දෙපාර්තමේන්තුව කොළඹ 10

<u>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනසහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

1.2 (අ) විගණිත කරුණ සමඟ එකඟ වන අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතින්ට අනුව අදාල නිවරුදි කිරීම 2020.12.31 දිනෙන් අවසන් වර්ෂයේදී ගැලපීම් කර මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කරන බව කාරුණිකව දන්වා සිටිමු.

1.2 (ආ) විගණිත කරුණ සමඟ එකඟ වන අතර 2020.12.31 දිනෙන් අවසන් වර්ෂයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු සම්පාදනය කරනු ලැබේ.

එසේම ප්‍රමිතියේ 21 වගන්තිය අනුව ප්‍රාග්ධනිත කර තිබෙන පුනරාවර්ථන වියදම ද නැවත නිවරුදි ලෙස ගිණුම් තුල ගැලපීම් සිදුකර 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් වාර්තා විගණකාධිපති දේපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමු.

1.2 (ඇ) පිරිවැය රු.53,925,596 ක අගයෙන් යුතු අයිතමයන් සඳහා ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කර 2020.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් තුල ද සංශෝධනය කර ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි.

1.2 (ඈ) 2020.12.31දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ගංකා සාගර විශ්වවිද්‍යාලයේ අවසන් ගිණුම් සකස් කිරීමේ දී මෙම දෝෂය නිවරුදි කර අදාල වත්කම් ගිණුමේ , අත්තිකාරම් ගිණුමේ ශේෂය යාවත්කාලීන කිරීමට කටයුතු සිදුකිරීමට උපදෙස් ලබා දී ඇත.

1.2 (ඉ) 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අවසන් ගිණුම් සකස් කිරීමේ දී මෙම දෝෂය නිවරුදි කර අදාල වත්කම් ගිණුමේ හා ඌණතා හා අතිරික්තතා ගිණුමේ ශේෂය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

1.2 (ඊ) මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් සඳහා විස්තරාත්මක උපලේඛණ මේ වන විට ද ඔබ වෙත ඉදිරිපත් කර ඇති බව සඳහන් කරමි. ඉදිරියේ දී එකී ශේෂයන් වඩාත් විධිමත් අයුරින් හඳුනාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

2. **<u>වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව ඡේදය</u>**

(අ) 2014 අංක 31 දරණ සාගර විශ්වවිද්‍යාල පනත.	2014 අංක 31 දරණ සාගර විශ්වවිද්‍යාල පනතේ 10(1) වගන්තිය ප්‍රකාරව කටයුතු සිදු කෙරෙමින් පවතී.
10(1) හා 10(3) වගන්ති -	- මේ වන විට වැඩ බලන ප්‍රතීතන හා තත්ත්ව සහතික කිරීමේ අධ්‍යක්ෂවරයකු පත් කර ප්‍රතීතනය සිදුකර ගෙන යමින් පවතී.

(ii) 45 වගන්තිය - 2020 වර්ෂය වෙනුවෙන් රාජ්‍ය භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්ථන හා ප්‍රාග්ධන අරමුදල් නිසි පරිදි වෙන් කර අනුමතකිරීමෙන් පසු 45 වගන්ති ප්‍රකාරාව වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ අයවැය ගත මුල්‍ය ප්‍රකාශන සකස්කර පාලන මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
මුදල් රෙගුලාසී සංග්‍රහයේ මුදල් රෙගුලාසී 206 හා 565 (2) - තැන්පතු ලේඛණය පවත්වා ගෙන යෑමට කටයුතු කරන ලද අතර නිශ්චිත දිනකට එක් පුද්ගලයකුට නිරවුල් කිරීමට ඇති වටිනාකම් හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර 2020.12.31 අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් සමඟ ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

3. වෙනත් නිරීක්ෂණ කරුණු

(අ) (i) පවත්නා දේශන ශාලා හා පන්ති කාමර මත පදනම්ව උපරිම ධාරිතාවයෙන් බඳවා ගැනීම සිදුකර ඇත. 2020 වර්ෂයේ දී පාඨමාලා හයක් දක්වා වර්ධනය කර සිසුන් බඳවා ගැනීමට ද කටයුතු කර ඇත. විශ්වවිද්‍යාලය සඳහා අවශ්‍ය විද්‍යාගාර හා වැඩහල් බාහිර පාර්ශවයන් ගෙන් කුලී පදනම මත ලබා ගන්නා බැවින් , ඉදිරියේ දී එම පහසුකම් වැඩි කිරීමෙන් පසුව බඳවා ගැනීම් වැඩි කර ගැනීමට බලාපොරොත්තු වේ.2024 වර්ෂයේ දී කොරියානු රජයේ අනුග්‍රහයෙන් ලැබීමට නියමිත “KOICA” ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාලය වැඩි දියුණු කර අවශ්‍ය පහසුකම් ස්ථාපිත කරමින් වර්ෂයකට සිසුන් 1600 ක් බඳවා ගැනීමට ද යෝජිත වේ.

(ii) සමාලෝචිත වර්ෂය තුල අදාල ක්ෂේත්‍රයේ ස්ථිර උපදේශකවරුන් ප්‍රමාණවත් පරිදි නොසිටී අතර එම පත්වීම් ලබා ගැනීම සඳහා කෙටි කාළයක් තුළ පාලන මණ්ඩල සමාජිකයින් වරින් වර වෙනස් වූ බැවින් බාහිර හා කොන්ත්‍රාත් පදනම් මත බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය නියම කාලසීමාව තුල ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වූ බැවින් බාහිර උපදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදුකිරීමට නොහැකි වීම මත සැළසුම් කළ පරිදි බඳවා ගැනීම් සිදුකිරීමට නොහැකි විය .

(ආ) බොහොමයක් දේශණ කටයුතු සිදුවනුයේ බාහිර කථිකාචාර්යවරු මඟිනි. ඔවුන්ගේ දේශණ වාර්තා පොත් සම්පූර්ණ කිරීමට ඔවුන් වෙත දැනුම් දී ඇති අතර මේ සඳහා නව සරළ ක්‍රම වේදයක් හඳුන්වා දීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. එසේම, පීඨාධිපතිවරුන් හා අධ්‍යයන අංශ ප්‍රධානීන් මාර්ගයෙන් මේ සඳහා පිළිගත හැකි ක්‍රම වේදයක් සකස් කරනු ලැබේ.

(ඇ) මෙම ගැටළුව හදුනාගෙන ඇති අතර විශ්ව විද්‍යාලය තුළ විභාග පැවැත්වීමට හා ඊට සම්බන්ධ වන සිසුන් සඳහා අතුරු සඳහා අතුරු සම්මත නීතියක් (By Laws) සම්මත කර 2020 සිට ක්‍රියාත්මක කෙරේ. එසේම විභාගයට ඉදිරිපත් වන ළමුන් ගේ අත්සන් සහිත ලේඛනයක් විභාග අංශයේ නඩත්තු කරනු ලැබේ.

(ඈ) බොහොමයක් විභාග ප්‍රශ්ණ පත්‍ර සමීක්ෂණය කරනුයේ බාහිර කථිකාචාර්යවරුන් විසිනි. ඔවුන්ගෙන් ප්‍රතිඵල ලබා ගැනීමේ දී ප්‍රමාදයක් සිදුව ඇත .එය වලක්වා ගැනීම සඳහා නිත්‍ය කථිකාචාර්යවරුන් බඳවා ගැනීම සඳහා කළමණාකාර සේවා දෙපාර්තමේන්තුව වෙත ලිඛිත ඉල්ලීම් කර ඇත.

(ඉ) 2017 මුල් වරට ඇතුළත් කිරීමේ ප්‍රතිඵල හා තත්ත්ව සහතික කිරීමේ සභාව පවත්වන ලදී. එය සෑම වර්ෂයකදීම ඉන් පසු පවත්වන ලදී. එහිදී මුල් වර්ෂ වලදී විශ්වවිද්‍යාලයේ පැවති මූලික ගැටළුවක් වූ අන්තර්ග්‍රහණය සම්බන්ධ කරුණු නිරාකරණය කිරීමට කටයුතු යොදන ලද්දේ එම ගැටළු විසඳා ගත නොහැකිව විශ්වවිද්‍යාලයක් වශයෙන් ඉදිරියට පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයක් උදාවී තිබූ හෙයිනි. නමුත් අවසන් වරට පැවැත්වූ ප්‍රතිඵල හා තත්ත්ව සහතික කිරීමේ සභාවේ දී උසස් අධ්‍යාපන පාඨමාලා 06 ක් පැවැත්වීමට අනුමැතිය ලබා ගැනීම වැනි උසස් අධ්‍යයන කටයුතු සම්බන්ධව තීන්දු තීරණ ලබා දෙන ලදී.

(ඊ) සාගර විශ්ව විද්‍යාල පනත මඟින් යාත්‍රා නඩත්තු ඒකකයක් පවත්වාගෙන යෑමට කටයුතු කරන ලෙස සඳහන් වුවත් ඒ සඳහා අවශ්‍ය පුහුණු කාර්ය මණ්ඩලය නොමැති බැවින් ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ලිඛිතව දන්වා ඇත. එසේම සමහරක් යාත්‍රා ධාවන තත්ත්වයේ නොපැවති අතර ඒ අතුරින් අළුත්වැඩියා කළ හැකි මට්ටමේ යාත්‍රාවක් 2020 වර්ෂයේ දී අළුත්වැඩියා කොට පුහුණු කටයුතු සඳහා අවශ්‍ය පරිදි සූදානම් කර ඇති අතර, භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින යාත්‍රා අළුත්වැඩියා නොකර අපහරණය කිරීමට කටයුතු යොදන ලදී. එසේම තාවකාලීන විසඳුමක් වශයෙන් එම ඒකකය පිහිටුවා වැඩ බලන සුපරීක්ෂක වරයෙක් පත් කර ඇත.

(උ) අදාල නේවාසිකාගාර තැන්පතු මුදල ලබා ගැනීමට උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ කරුණු විමසා ඇතර ඒ පිළිබඳව ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.

(ඌ) මෙකී ශේෂයන් ගිණුම් තුලින් ලියා හැරීම සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවස්ථා කිහිපයක දී ම විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර එම කමිටුවේ නිර්දේශ සහිතව එවකට පැවැති පාලක සභාවේ අනුමැතිය සහිතව රේඛීය අමාත්‍යාංශය මඟින් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කළ ද එකී ශේෂයයන් ගිණුම් තුලින් ලියා හැරීමට අවශ්‍ය අනුමැතිය නොලැබුණි.

එසේම, නැවත වරක් මෙකී ණය ශේෂ ගිණුම් තුලින් ලියා හැරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා 2019 වර්ෂයේ දී ද එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන ගරු (වැඩ බලන)අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ද ඉදිරිපත් කළ අතර එකී සංදේශය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල තීරණය කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන) විසින් උපකුලපති අමතා එවන ලද අතර, එකී තීරණය ද සමඟ නැවත වරක් දීර්ඝ කාලයක් සිට නිරවුල් නොකරණ ලද එකතු වටිනාකමරු. 13,784,801/-ක ශේෂය යැයි විගණකාධිපති වාර්තාවේ ඇතුලත් මෙකී ශේෂය නිරවුල් කිරීම සඳහා ද 2020 වර්ෂයේ පළමු වන

විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට පත්‍රිකාවක් සකස් කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ මත ඉදිරි පියවර ගැනීමට උපදෙස් ලබා දී ඇත.

(එ)උසස් අධ්‍යයන අංශයේ ආයතනයේ කාර්යමණ්ඩලය 33 ක් වන අතර ඉන් 28 දෙනෙකු බඳවාගෙන ඇත.එවිට පුරප්පාඩු සංඛ්‍යාව 3 කි.වෘත්තීය පුහුණු අංශයේ සේවක සංඛ්‍යාව 69 කි.ඉන් අන්තර්ග්‍රහණය වී ඇත්තේ 11කි. පුරප්පාඩු පිරවීමේදී කළමණාකරනසේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති වැටුප් කේතයන්හි වූ ගැටළුකාරී තත්ත්වයන් මත බඳවා ගැනීමට අපොහොසත් වී ඇත.

(ඒ) විශ්වවිද්‍යාලයේ පාඨමාලා 5 ක විෂයන් 65 ක් ආවරණය කිරීමට අවම වශයෙන් කථිකාචාර්යවරුන් 13ක් වත් එක් දෙපාර්තමේන්තුවක් වෙත ලබා දිය යුතුයි. එනමුත්, දැනට පවතින කථිකාචාර්යවරුන් නිසියාකාරයෙන් පාඨමාලා පවත්වා ගෙන යෑම සඳහා ප්‍රමාණවත් නොවනු බැවින් විශ්වවිද්‍යාලය බාහිර කථිකාචාර්යවරුන් ගේ සහය ලබා ගැනීමට කටයුතු කර තිබුණි. සමාන්‍යය වශයෙන් එක් උපාධි පාඨමාලාවක අන්තර්ගත විෂය නිර්දේශ මාලාවක් ආවරණය කිරීම සඳහාත් උසස් අධ්‍යයන අංශයේ පරිපාලන කටයුතු සඳහාත් දෙපාර්තමේන්තුවකට කථිකාචාර්යවරුන් 13 කු පමණ අවශ්‍ය වේ. ඒ අනුව විශ්වවිද්‍යාලයේ කටයුතු ඉතාමත් කාර්යක්ෂමව සඵලදායීකත්වයෙන් සිදුකිරීමට තත්කාලීන වශයෙන් කථිකාචාර්වරුන් 65 දෙනකුගේ සේවය අවශ්‍ය වුවත් 37 දෙනකුගේ පමණ සේවයේ හිඟයක් පවතී . මේ වන විට උසස් අධ්‍යයන අංශය සඳහා නව කථිකාචාරුන් 20 කු බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. විශ්වවිද්‍යාලය සඳහා අවශ්‍ය අධ්‍යයන කාර්යමණ්ඩලය හැකි ඉක්මනින් අනුමත කරවාගෙන පුරප්පාඩු සම්පූර්ණය කිරීමත් සමඟ මෙකී ගැටළුව නිරාකරණය වනු ඇත.

(ඔ) ප්‍රාදේශීය මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක වන වෘත්තීය පාඨමාලා 23 ක් පවත්වා ගෙන යන අතර එම මධ්‍යස්ථාන වැඩි ප්‍රමාණයක නිත්‍ය උපදේශකවරුන් නොමැති බැවින් පාඨමාලා නිසියාකාරව පවත්වා ගෙන යාමට දැනට බාහිර හා කොන්ත්‍රාත් පදනම මත කථිකාචාර්ය වරුන් බඳවාගෙන ඇත. වෘත්තීය අධ්‍යයන අංශය සඳහා අනුමත උපදේශකවරුන් ගේ සංඛ්‍යාව 69 දෙනෙකි. ඉන් මේ වන විට 18 දෙනෙකු සේවයේ යෙදී සිටිය ද සෙසු උපදේශකවරුන් බඳවා ගැනීම සඳහා අන්තර්ග්‍රහණ ගැටළු සහ ආයතන ව්‍යුහය පිළිබඳ එකඟතාවයකට පැමිණිය යුතු බැවින් ඒ පිළිබඳ ඉදිරි කටයුතු 2020 වසර තුලදී නිවරුදි කර ගැනීමට ක්‍රියා කරමින් පවතී.



මහාචාර්ය නලින් රත්නායක
උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.



නිපුණතා සංවර්ධන, රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
திறன்கள் அபிவிருத்தி, வேலை வாய்ப்பு மற்றும் தொழில் உறவுகள் அமைச்சு
Ministry of Skills Development, Employment and Labour Relations

Printed by: Metropolitan - Printers